රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

RG/MBD/01/චක්‍රලේඛ

මගේ අංකය / எனது இல. / My No.

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/ A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2022.07.18

චක්‍රලේඛ අංකය - 09/2022

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් මගින්

අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**<u>රටෙහි වර්තමානයේ පවතින භෞතික සම්පත් කළමනාකරණ අවශ්‍යතාව හමුවේ උපත්,විවාහ හා මරණ ලේඛන වල සහතික පිටපත් නිකුත් කිරීම.</u>**

රටතුළ වර්තමානය වන විට පවතින ආර්ථික අර්බුදය හමුවේ ලිපිද්‍රව්‍ය මෙන්ම මුද්‍රණ යන්ත්‍ර සඳහා අවශ්‍ය ටෝනර් ලබා ගැනීමේ අපහසුතා පවතින බැවින් උපත්,විවාහ හා මරණ ලේඛන වල සහතික පිටපත් නිකුත් කිරීම ගැටළු සහගත වීමේ අවදානමක් පැන නැගී ඇත.

02. මේ සඳහා විසඳුමක් ලෙස යම් ඉල්ලුම්කරුවෙකු සතුව පැහැදිලි, පිරිසිදු සහතික පිටපතක් ඇත්නම් එය පරීක්ෂා කර නැවත තහවුරු කිරීමේ මුද්‍රාවක් සහිතව නිකුත් කිරීමේ ක්‍රමවේදයක් කෙරෙහි තාවකාලිකව යොමු වීමට තීරණය කර ඇත. එබැවින් උක්ත සහතික පිටපත් නිකුත් කිරීමේ දී පහත සඳහන් ක්‍රමවේද අනුගමනය කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

I. සහතික පිටපත් ඉල්ලුම්කරන්නකු සතුව අදාළ සහතිකයෙහි පැහැදිලි, පිරිසිදු සහතික පිටපතක් ඇති නම් එය දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් අංශයෙහි පවත්වාගෙන යනු ලබන මුල් පිටපත හෝ e-BMD දත්ත පද්ධතිය මගින් පරීක්ෂා කර නිවැරදි පිටපතක් බව තහවුරු කර ගැනීම.

II. එලෙස තහවුරු කර ගැනීමෙන් පසු ඉල්ලුම්කරු සතුව පවතින පිටපතෙහිම පහත දක්වා ඇති මුද්‍රාව හා සහතිකය අත්සන් කරනු ලබන නිලධාරියාගේ නිල මුද්‍රාව තබා එය ඉල්ලුම්කරු වෙත නිකුත් කිරීම. (අදාළ මුද්‍රාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සකසා ගත යුතු වේ)

> ඉල්ලුම්පත් අංකය : .....................
>
> ඉල්ලුම්කරු සතුව පවතින ..................................දිස්ත්‍රික්කයේ ........................ කොට්ඨාශයට අයත් මෙම සහතිකය මෙම කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන යාවත්කාලීන කරන ලද දත්ත පද්ධතියේ තොරතුරු/ උපත්/විවාහ /මරණ ලේඛන සමග පරීක්ෂා කර සන්සන්දනය කර සහතික කරමි.
>
> පරීක්ෂා කලේ : .........................
>
> දිනය : ...........................  ......................................
>
> අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්

දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail rgd@sltnet.lk rg@rgd.gov.lk

III. මෙහිදී අදාළ සහතිකය මුල් ලේඛනය හෝ e-BMD දත්ත පද්ධතිය මගින් පරීක්ෂා කර නිවැරදි පිටපතක් බව තහවුරු කරගන්නා බැවින් සහතික පිටපත් නිකුත් කිරීමට අදාළ මුදල් අයකිරීමෙහි කිසිදු වෙනසක් සිදු නොවිය යුතුය.

03. මෙම ක්‍රමවේදය අනුගමනය කිරීමෙහි ප්‍රධාන අරමුණ වනුයේ ලිපිද්‍රව්‍ය හා මුද්‍රණය සඳහා අවශ්‍ය අනෙකුත් සම්පත් භාවිතය අවම කිරීම වන අතර, උක්ත ක්‍රමවේදය අනුගමනය කිරීමට නොහැකි සහතික සම්බන්ධයෙන් සාමාන්‍ය ක්‍රමවේදය අනුගමනය කිරීමට කටයුතු කළ යුතු වේ.

04. රටෙහි පවතින වර්තමාන තත්ත්වය සැළකිල්ලට ගනිමින් උක්ත ක්‍රමවේදය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර, මෙම ක්‍රමවේදය සාර්ථක කර ගැනීම සඳහා ඔබ සැමගේ සහාය අපේක්ෂා කරමි. මෙම චක්‍රලේඛය 2022.07.20 දින සිට ක්‍රියාත්මක වේ.

පී.එස්.පී.අබේවර්ධන

රෙජිස්ට්‍රාර් ජනරාල්.

පිටපත :

01.ලේකම් - දැ.ගැ.ස.

රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

02.ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය - දැ.ගැ.ස.

03. සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත - දැ.ගැ.ස. හා අ.ක.ස.

04.කොමසාරිස් ජනරාල්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස.

05.කොමසාරිස් ජනරාල්, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව- දැ.ගැ.ස.

06.සියලුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැ.ගැ.ස. හා අ.ක.ස.

07.දෙපාර්තමේන්තුවේ සියලුම විධායක හා මාණ්ඩලික නිලධාරීන් - දැ.ගැ.ස. හා අ.ක.ස.